**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2023**

---

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදෙන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 වර්ෂයට අදාල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම් , වගකීම්, ආදායම් හා වියදම්

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | වටිනාකම |
|---|---|
| | රු. |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 14,615,806 |
| ජංගම වත්කම් | 20,797,660 |
| **මුළු වත්කම්** | **35,413,466** |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 20,544,005 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 10,791,212 |
| ජංගම බැරකම් | 4,078,249 |
| **මුළු බැරකම්** | **14,869,461** |
| මුළු ආදායම | 47,639,043 |
| මුළු වියදම | 43,898,460 |
| **අතිරික්තය** | **3,740,583** |

## 2.3 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i)මුදල් රෙගුලාසි 119 | PD-6379 අංක දරන කැබ් රථය 2020 වර්ෂයේදී සභාපතිවරයා විසින් ධාවනය කරමින් සිටින අවස්ථාවේ ඇති වූ යාන්ත්‍රික දෝෂයක් පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණයෙන් අළුත්වැඩියාව සඳහා වැය වූ රු. 498,110ක මුදල සභාපතිවරයාගෙන් | මෙම අලුත්වැඩියාව සඳහා වැය වූ රු.498,110 මුදල අය කර ගැනීමට අදාලව පළමු හා දෙවන සිහිකැඳවීම් ලිපි යොමු කලද ඒ මහතා විසින් ප්‍රතිචාර නොදක්වන ලද හෙයින් විගණන කමිටු නිර්දේශ මත කර්මාන්ත අමාත්‍යාංශයේ නීති අංශය හරහා නඩු | පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ ප්‍රකාරව පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අය කර ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. එසේ වුවද එම මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පැවරීමට එම කමිටු වාර්තාවේ පිටපතක් සහිතව අදාල ලිපිය කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | |
| (ii)මුදල් රෙගුලාසි 395 (ඇ) | සෑම මාසයක් අවසානයේදීම ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, අධිකාරිය විසින් 2023 දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම් ප්‍රකාශය විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2024 ජූලි 19 වැනි දින, එනම් මාස 6ක ප්‍රමාදයකින් පසුව විය. | එකඟ වෙමි. මු.රෙ.395 (ඇ) අනුව මේ වන විට සෑම මසකම 15 වන දිනට ප්‍රථම බැංකු සැසඳුම් පිළියෙළ කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව බැංකු සැසඳුම් නියමිත දිනට පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii)මුදල් රෙගුලාසි 502(2) | එක් එක් අංශ සතුව භාවිතයේ පවතින ස්ථාවර වත්කම් පිළිබඳ සම්මත වර්ගීකරණ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් වත්කම් වල භෞතික වශයෙන් ඇති ප්‍රමාණය ස්ථාවර වත්කම් ලෙජරය සමග සසඳා නොතිබුණි. වත්කම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය නොකිරීම හේතුවෙන් වත්කම් වල භෞතික පැවැත්ම කළමනාකරණයට තහවුරු කර ගත නොහැකි අතර වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් කළමනාකරණයේ නිසි | අධිකාරියේ ස්ථාවර වත්කම් කළමනාකරණයේ දෝෂ දකින්නට ලැබෙන බව පිළිගනිමි. විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත. අධිකාරියේ වත්කම් QR කේත යොදා ගනිමින් අංකනය කර ඇති අතර එහි වැඩි දියුණු කිරීම මේ වන විට සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව ස්ථාවර වත්කම් පැවැත්ම, ආරක්ෂාව හා වාර්තා තබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අවධානය යොමු වී ද නොතිබුණි. | | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 756 (6) | අධිකාරියේ 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2023 මැයි 31 දින එනම් මාස 05ක ප්‍රමාදයක් සහිතව පත්කර තිබුණු අතර, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් අත්සන් නොකරන ලද කෙටුම්පත් වාර්තාවක් පමණක් 2024 අගෝස්තු 30 දින වනවිට විගණනයට ඉදිරිපත් කර තිබුණි. තවද 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2024 අගෝස්තු 30 දින වනවිටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කිරීම ප්‍රමාද වී ඇති බව පිලිගනිමි. 2022 වර්ෂයට අදාළ සමීක්ෂණ වාර්තාව 2024 අගෝස්තු මස 02 වන දින සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී විගණන හා කළමනාකරණ කමිටුවේ නිරීක්ෂණ සඳහා යොමු කරන ලද අතර ඊලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2023 දෙසැම්බර් මස 11 දින පත්කර ඇති අතර මෙම සමීක්ෂණයට අදාළ වැඩ කටයුතු බොහෝමයක් මේ වන විට අවසන් වී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල සටහන අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්ගේ යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය | අධිකාරියෙහි කාර්යය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ස්ථාපිත කර නොතිබුණු අතර ඒ සඳහා වැඩ බැලීමේ නිළධාරියෙකු පත් කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව අභ්‍යන්තර විගණකවරයෙක් පත්කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.4 අත්තිකාරම් පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව නිලධාරියෙකුට ලබාදුන් අත්තිකාරම් මුදලක් දෙන ලද කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවද, 2023 වර්ෂය තුල අවස්ථා 185කදී ලබාදුන් රු.2,891,029ක් වූ අත්තිකාරම් ලබාගත් කාර්ය නිමකර ඇතත් 2024 සැප්තැම්බර් 30 දින වනවිටත් පියවා නොතිබුණි. | එකඟ වෙමි. මේ වන විට අත්තිකාරම් පියවීම් පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කර ඇති අතර පියවීම් කටයුතු සිදු කරමින් පවතී. | අත්තිකාරම් පාලනය සඳහා වන විධිවිධාන ඇතුළත් මුදල් රෙගුලාසි අනුව කටයුතුකර, දෙන ලද කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) තවද 2017, 2018, 2019, 2021 සහ 2022 යන වර්ෂවල ලබාදුන් පිළිවෙලින් රු.353,850, රු.586,330, රු.657,322, රු.213,575, සහ රු.4,327,165 ක අත්තිකාරම් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. | එකඟ වෙමි. මේ වන විට අත්තිකාරම් පියවීම් පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කර ඇති අතර පියවීම් කටයුතු සිදු කරමින් පවතී. | අත්තිකාරම් පාලනය සඳහා වන විධිවිධාන ඇතුළත් මුදල් රෙගුලාසි අනුව කටයුතුකර, දෙන ලද කාර්ය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) එක් එක් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන පැවැත්වූ ස්ථානය, දිනය, සහභාගී වූ පුහුණුලාභීන් සංඛ්‍යාව හා ඒ පිළිබඳ විස්තර, දරන ලද වියදම, ගෙවූ අත්තිකාරම්, එම අත්තිකාරම් පියවීම පිළිබඳ විස්තර, පුහුණුලාභීන්ගේ | එකග වෙමි. සමාලෝචිත වර්ෂය තුල සියලු තොරතුරු ඇතුලත් වාර්තා පවත්වාගෙන නොයන අතර සමහර තොරතුරු පමණක් දිස්ත්‍රික් හා ප්‍රධාන කාර්යාලයේ පවත්වා ගෙනයයි. සමාලෝචිත වර්ෂයේ සහ ඉදිරියේදී මෙම තොරතුරු විධිමත්ව ප්‍රාදේශීය නිලධාරීන් හරහා ලබා ගැනීමට අධිකාරිය අපේක්ෂා කරයි. | සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ඇතුළත්ව ව්‍යවසාය සංවර්ධනය පිළිබඳ දත්ත පද්ධතියක් යාවත්කාලීනව |

| | | |
|---|---|---|
| ව්‍යවසාය සංවර්ධන ප්‍රගතිය වැනි සියළු තොරතුරු ලබාගත හැකි වාර්තාවක් හෝ දත්ත පදනමක් (Data Base) අදාල අංශය තුල පවත්වාගෙන නොතිබුණි. | | පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ)අධිකාරිය සඳහා ISO සහතිකය ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේදී රු.71,762ක් ද, 2017 වර්ෂයේදී රු.125,000ක්ද, 2018 වර්ෂයේදී රු.35,880ක්ද වශයෙන් එකතුව රු.232,642ක මුදලක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ISO සහතිකය ලබාගෙන නොතිබුණි. | 2016 වර්ෂයේ සිට අවස්ථා කීපයකදී ආයතනය ස්ථාන කීපයකට මාරු වීම හා පසුගිය වර්ෂවලදී ඇති වූ කොවිඩ් බලපෑම හේතුවෙන් මෙම කටයුතු ප්‍රායෝගිකව සිදුකර ගත නොහැකි වී ඇත. මේ සඳහා ආයතනයේ අභ්‍යන්තර ක්‍රියා පටිපාටින් අධිකාරිය විසින් සකස් කර ඉදිරිපත් කලයුතුව තිබූ අතර ඒ සඳහා තෝරාගත් ආයතනයට ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති වීම, මෙම ක්‍රියා පටිපාටි අභ්‍යන්තර වශයෙන් සකස් කිරීම සඳහා ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් එවකට නොසිටීම වැනි හේතු නිසා මෙම කටයුතු නැවතී ඇත. එසේම, අදාල වර්ෂවල අවසන් ගිණුම් සැකසීම ප්‍රමාද වී තිබීම හේතුවෙන් ඒ පිළිබඳව විගණන කටයුතුද ප්‍රමාද වීමෙන් ආයතනයේ තත්ව විගණනයක් සිදුකිරීමට ඒ වනවිට නොහැකි විය. මේ වන විට ISO ලබා ගැනීමට ප්‍රතිපාදන වෙන් කර නොමැති අතර ඉහත කටයුතු අවසන් වූ පසු නැවත ISO ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කල හැකි වේ. | සැළසුම් කර ඇති ආකාරයට ISO සහතිකය ලබා ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන භාණ්ඩ, සේවා හා වැඩ සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය අනුව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සකස් කර තිබූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම තුල ප්‍රසම්පාදන කාර්යයන්හි ආරම්භක සහ අවසාන දින නිර්ණය කර නොතිබූ අතර ඒ වෙනුවට ගිණුම් වර්ෂයේ ආරම්භක | එකඟ වෙමි. අධිකාරිය සැලසුම් කල පරිදි භාණ්ඩාගාරය හරහා අදාල දින වකවානු තුල මුදල් නොලැබෙන හෙයින් අදාල ප්‍රසම්පාදන කටයුතු සඳහා නිශ්චිත දිනයක් ප්‍රකාශ කල නොහැක.එබැවින් ගිණුම් වර්ෂය ආරම්භක හා අවසාන දින මේ සඳහා යොදන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව සියළු ප්‍රසම්පාදන කාර්යයන් ඇතුලත් වූ නිශ්චිත දින වකවානු සහිතව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතුය. |

සහ අවසාන දින යොදා තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අරමුණු ඉටුකර නොගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 13 (ආ), 13 (ඉ) සහ 13 (උ) වගන්ති අනුව අධිකාරියේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවධානය යොමුකර නොතිබුණි. | | |
| (i) විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. | එකඟ වෙමි. ව්‍යවසායන් ජාත්‍යන්තරීකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් තුලින් වක්‍රව දායක වෙයි. මෙම අරමුණ වෙනුවෙන්ම විශේෂයෙන් පිහිටුවා ඇති අපනයන සංවර්ධන මණ්ඩලයට අපගේ ව්‍යවසායකයින් යොමු කිරීම සිදුකර ඇත. කෙසේ නමුත් 2024 වර්ෂයේ සිට මෙම අරමුණ ඉෂ්ට කිරීමෙහිලා ව්‍යවසායකයින් අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගී කරවීම, දේශීය, විදේශීය වාණිජ මණ්ඩල හරහා ව්‍යාපාර සම්බන්ධීකරණයන් ගොඩනැගීම සඳහා වැඩමුළු/ සාකච්ඡා වලට සම්බන්ධ වීම, තාක්ෂණික හුවමාරුව සඳහා විදේශීය ව්‍යාපාරික ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකිරීම ආදිය තුලින් ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර පිහිටුවීම සඳහා උනන්දු වීම හා ඒ සඳහා අවස්ථාව උදාවනු ඇත. | පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ප්‍රමුඛතාවයේලා කටයුතු කළ යුතුය. |
| (ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතිය වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම. | එකඟ වෙමි. පනතෙහි සඳහන් පරිදි තාක්ෂණික අරමුදලක් ඇතිකිරීමට අධිකාරියට මේ දක්වා හැකියාව ලැබී නැත. මේ සඳහා මූලික අරමුදල් සපයා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 2019 වර්ෂයේ යෝජනා ඉදිරිපත් කලද ඒ සඳහා අනුමැතිය නොලැබුණි. ඉදිරියේදී මේ සඳහා යෝජනා කර අනුමැතිය ලබාගෙන මූල්‍ය පහසුකම් ලබා ගැනීමට සැලසුම්කර ඇත. | පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ප්‍රමුඛතාවයේලා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් වරලත් ව්‍යාපාර (Franchise Shops) මඟින් අවම වශයෙන් සැපයුම්කරුවන් 25 දෙනෙකු හඳුන්වා දීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී එකදු වරලත් ව්‍යාපාරයක්වත් ආරම්භ කර නොතිබුණි. | පනතේ 13(ඉ) වගන්තිය ප්‍රකාරව සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2023 ක්‍රියාකාරී සැලැස්ම තුළ වරලත් අලෙවිසල් පිහිටුවීමට සැලසුම් කර තිබිණි. මේ සඳහා සුදුසු පාර්ශවයක් සොයාගැනීමට නොහැකි විය. තවද ප්‍රමාණවත් මුදල් නොමැති වීමෙන් එම මුදල වෙනත් ඵලදායී කටයුතු සඳහා යොදවන ලදී. | පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ප්‍රමුඛතාවයේලා කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරිය විසින් පුහුණු කිරීම් සහ මූල්‍යාධාර සැපයීම් මඟින් සංවර්ධනය කරන ව්‍යවසායකයන් සම්බන්ධයෙන් කාලීනව පසුවිපරම් කිරීම හෝ ඇගයීම් කිරීම සඳහා ඇගයීම් නිර්ණායක හඳුන්වා දී නොතිබුණු අතර එක් එක් සංවර්ධන වැඩසටහනෙන් බිහි වූ ක්‍රියාකාරී ව්‍යවසායකයන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ව්‍යවසායකයත්ව ප්‍රගතිය සම්බන්ධයෙන් ඇගයීම් සිදු කරන බව තහවුරු නොවීය. එබැවින් අධිකාරියේ ප්‍රධාන අරමුණ වූ ක්‍රියාකාරී ව්‍යවසායකයින් බිහි කිරීමේ අරමුණ ඉටුවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් විගණනයේදී ඇගයීම් කිරීමට නොහැකි විය. | එකඟ වෙමි. අධිකාරිය මගින් ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශීය නිලධාරීන් හරහා ක්‍රියාත්මක කරනු ලබයි. සංවර්ධනය වූ සහ නව ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුලත් වාර්තා ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙන යයි. ප්‍රාදේශීය නිලධාරීන් වෙත වාර්ෂිකව ලබා දෙන ඉලක්ක ඇතුලත් ක්‍රියාකාරී සැලසුම් අනුව එක් එක් නිලධාරීන්ගේ ප්‍රගතිය, වර්ෂය අවසානයේ අලුත් ව්‍යවසායකයින්ගේ සහ සංවර්ධනය වන ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාවන් වාර්ෂිකව අධිකාරිය මගින් ලබාගනී. සියලු සංවර්ධන වැඩසටහන් වල ප්‍රතිඵල වර්ෂ අවසානයේ ලබා ගනී. වර්ෂයේ බිහි වූ ව්‍යවසායකයින්ගේ සංඛ්‍යාව සඳහන් තොරතුරු අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මගින් පවත්වාගෙන යයි. | ඇගයීම් නිර්ණායක හඳුන්වාදීමට සහ ව්‍යවසායකත්ව ප්‍රගතිය සම්බන්ධයෙන් නිසි පරිදි වාර්තා තබාගෙන ඇගයීම සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.2 ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත සඳහන් පරිදි විය. | | |
| (i) 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව Made in Sri Lanka වෙළඳ ද්වාරය තුල අවම වශයෙන් සැපයුම්කරුවන් 1000 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල සැපයුම්කරුවන් 216 දෙනෙකු පමණක් ලියාපදිංචි කර තිබුණි. | එකඟ වෙමි. Made in Sri Lanka වෙළඳ ද්වාරය 2021 දෙසැම්බර් 11 වන දින දියත් කර ඇතත්, 2023 ඔක්තෝබර් 16 වන දින ස්ථාපිත කරන ලද තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධති විශ්ලේෂණයක් සිදු කර අඩුපාඩු හඳුනා ගන්නා ලදී. මේ වන විට ඉහත අඩුපාඩු නිවැරදි කර ඇති අතර තොරතුරු තාක්ෂණ අංශය විසින් නැවත වරක් වෙළඳ ද්වාරයේ තත්ත්ව පරීක්ෂාවක් සිදු කරමින් පවතී. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) ක්ෂුද්‍ර, සුළු, හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අදාල දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අවම වශයෙන් ව්‍යවසායකයින් 750,000 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල ව්‍යවසායකයින් 260,000ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | එකඟ වෙමි. දත්ත පද්ධතියේ පැවති තාක්ෂණික දෝෂ හේතුවෙන් තොරතුරු ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇතුළත් කිරීමට නොහැකි විය. මේ වන විට එම ගැටලු විසඳා ඇති නමුත් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ජාතික කර්මාන්ත දත්ත පද්ධතියක් සකස් කිරීමට සැලසුම් කර ඇති බැවින් අප විසින් රැස් කරන ලද තොරතුරු ද එම දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීමට කර්මාන්ත අමාත්‍යාංශයට යවන ලදී. එබැවින් මෙම ව්‍යාපෘතියේ කටයුතු මේ වන විට තාවකාලිකව නතර කර ඇත. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 2023 වර්ෂයේ SME Connect Online Platform ව්‍යාපෘතියේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමෙන් සියයට 20ක් පමණක් විය. | 2023 ඔක්තෝබර් තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් පසුව, SME Connect වේදිකාව විශ්ලේෂණය කර, ගැටළු හඳුනාගෙන වැඩිදුර අත්‍යාවශ්‍ය වෙනස්කම් සහ වැඩිදියුණු කිරීම් සිදු කළහ. මෙම හේතූන් නිසා වාර්ෂික ඉලක්කය සපුරා ගැනීම සීමා වූ නමුත් SME Connect වේදිකාවට Deloitte සහ ADB ආයතන සමඟ සහයෝගයෙන්, දැනට විවිධ පාර්ශවයන් සම්බන්ධ කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කරමින් පවතී. | ප්‍රායෝගික තත්වයන් සලකා බලා සැලසුම් සකස් කළ යුතු අතර සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

## 4.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිතාවය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් රු.9,600,000ක් වැයකර 2021 වර්ෂයේදී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතියක් (MSME - Data Base) මිලදී ගෙන තිබුණ අතර පද්ධතියේ පවතින දෝෂ හේතුවෙන් විගණිත දිනය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | Made in Sri Lanka වෙළඳ ද්වාරය 2021 දෙසැම්බර් 11 වන දින දියත් කර ඇතත්, 2023 ඔක්තෝබර් 16 වන දින ස්ථාපිත කරන ලද තොරතුරු තාක්ෂණ අංශය විසින් පද්ධති විශ්ලේෂණයක් සිදු කර අඩුපාඩු හඳුනා ගන්නා ලදී. මේ වන විට අඩුපාඩු නිවැරදි කර ඇති අතර තොරතුරු තාක්ෂණ අංශය විසින් නැවත වරක් වෙළඳ ද්වාරයේ තත්ත්ව පරීක්ෂාවක් සිදු කරමින් පවතී. | දත්ත පද්ධතිය කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.4 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශයේ 4.2 (ඌ) ඡේදය අනුව අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටු රැස් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | එකඟ වෙමි. 2023 වර්ෂයේ මාර්තු මසදී සභාපතිතුමාගේ ඉල්ලා අස්වීම සිදු වූ අතර නව සභාපති /අධ්‍යක්ෂ ජනරාල්තුමා අප්‍රේල් මස පත් වීම භාර ගත් නමුත් , 2023-08-18 දින නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීම සිදු වූ බැවින් නව අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ විගණන කමිටු රැස්වීම් පත්වීමට සිදු වූ බැවින් විගණන කමිටු 2 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛය අනුව විගණන හා කලමනාකරණ කමිටු පැවත්වීමට කටයුතු කළ යුතුය. |